# Living the LOTUS
## Buddhism in Everyday Life

6 2018

VOL. 153


FOUNDER'S ESSAY

## හදපත්ලෙන්ම එන හැඟීම

මනුෂ්‍යයෙක් ලෙස තමාව ඔපදමා ගැනීමට හැකිවන්නේ, තමාට විරුද්ධව කටයුතු කරන පුද්ගලයන් හා තමා කියනා දේ ඇහුම්කන් නොදෙන පුද්ගලයන් සිටිනා විටයි. එවැනි පුද්ගලයන් හමුවූ විට 'මනුෂ්‍යයින් යනු අප සිතනා ආකාරයටම කටයුතු කරන අය නොවේ' ලෙස සිතෙයි.

සෑම දෙයක්ම පවසන ආකාරයටම 'හා හා' කියා භාර ගන්නේ නැතිව, විරුද්ධත්වය ප්‍රකාශ කරමින් වාගේම අපගේ වැරදි අඩුපාඩු පමණක් ගැන නිතර සොයනා පුද්ගලයන් සිටියත්, ඔවුන්ගේ මුහුණට මුහුණ සිටගෙන 'කුමන ආකාරයකින් හෝ ඔවුනට යථාර්තය අවබෝධ කරදිය යුතුය' ලෙස ගැඹුරින් කල්පනා කරන්න. එවිට නිතරම විරුද්ධත්වය ප‍්‍ර කාශ කරන පුද්ගලයන්ගේ සිතෙහි ඇතුලාන්තයේ ගැබ් වී තිබෙන පාළුව සාංකාව හා දුර්වලබව ටිකෙන් ටික පෙනේවී. ඒ ආකාරයට එම පුද්ගලයන්ගේ හදවත පෙනෙන විට, එම පුද්ගලයාව ඈත් කර තැබීමට නොහැකිවේ.

නොයෙක් ආකාරයේ පුද්ගලයන් සමග නිතරම හමුවෙමින්, එකට කටයුතු කරන විට 'මනුෂ්‍යයන්ගේ හැඟීම් මේ ආකාරයි නේ' ලෙස ග්‍රහණය කරගත හැකිවේ. එවිට ඕනෑම පුද්ගලයෙකු සමග කටයුතු කිරීමටද හැකිවේ. එය හදපත්ලෙන්ම එන හැඟීම වේ.

මනුෂ්‍යයින්ගේ හද පත්ලෙහි තිබෙන නියම හැඟීම අවබෝධ කර නොගෙන, නියමාකාර වූ දයාව ඔවුනට දැක්වීමටද නොහැකිවේ. එසේ වූ විට කවුරුත් තමාට අනුගත නොවේ.

*Kaiso zuikan* 9 පි. 64-65


**Living the Lotus**
**Vol. 153 (June 2018)**



Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



**Senior Editor:** Koichi Saito
**Copy Editors:** P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන , සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# නොසැලී සවිමත්ව සිටීම

**නිචිකෝ නිවානෝ**
**රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා**



## පළමුව, හොඳින් හුස්මක් ගන්න

ත්‍රිපිටකයේ ඉතාම පැරණි ධර්ම කාණ්ඩයක් වන ධම්ම පදයෙහි මෙසේ සඳහන් වේ. 'යමෙක් සිතේ හට ගත් ක්‍රෝධය, නොමඟ ගිය රථයක් හසුරුවා ගන්නාවූ රියැදුරෙකු මෙන් මනාව හසුරුවා ගනීද, මහු නියම රියැදුරෙකැයි මම හඳුන්වමි'.

මෙයින්, තරහව කෝපය පාලනය කර ගැනීමේ වැදගත්කම බුදුන් වහන්සේ විසින් පෙන්වාදෙයි. නමුදු, එසේ කියා දුන්නද හදවතේ තිරිංග තද කිරීම ඉතා අසීරුය, හදිසි කෝපයද එවැනි දෑට පමණක් සීමා නොවේ. එනම් නොකීමට නුසුදුසු දෑ පැවසීමටත්, ආශාවන් වල පෙලඹීමෙන් මිලදී නොගතයුතු දෑ මිලට ගැනීමටත්, නොමඟ යාමටත්, නොයෙක් කරුණු පාදක කරගෙන අන් අය සමඟ වාද විවාද වලට පැටලෙන පිරිසකි අපි.

එසේ කෝපය හා තරහව යන ආත්මාර්ථකාමී සිතැගි වල සැඩ පහරට ගසාගෙන යනවිට, නොසැලී සවිමත්ව සිටීමට හැකි වන්නේ කෙසේද?

මුලින්ම 'හොඳින් හුස්මක් ගන්නා' ලෙසයි මම නම් පවසන්නේ. එක් වරක් හොඳින් හුස්මක් ගැනීම තුලින් හදවත සැහැල්ලුවට පත්වේ. හැකිනම්, එක් රැයක් සන්සුන්ව හොඳින් කල්පනා කිරීමද වැදගත්ය.

එසේම බෞද්ධයෝ වන අපගේ සිතට රාග, ද්වේශ, මෝහය යන කළු වළාවන් ආ විට, 'බුදුන් වහන්සේ නම් කොහොම කල්පනා කරයිද', 'මොනවා කරයිද' ලෙස සිහියට නඟා ගන්නේ නම් නැවතත් සන්සුන් බවට පත්වීමට හැකිවේ. දෙවියන් බුදුන් පමණක් නොවේ, 'තාත්තා නම් මේ වෙලාවට මොනවා කරයිද', 'අම්මා නම් මේ වෙලාවට මොනවා කරයිද' ලෙස තමගේ සමීපයේම සිටි අය ගැන සිහියට නඟා ගනිමින් කෝපය හා තෘෂ්ණාවේ ආත්මාර්ථකාමී හැඟීම පාලනය කර ගැනීමට හැකිවේ.

'ආර්යය අෂ්ඨාංගික මාර්ගයේ' 2 වන කරුණ වන 'සම්මා සංකප්ප/ යහපත් සිතුවිලි' යනු, 'රාග, ද්වේශ, මෝහයෙන් ඈත්ව, බුදුන් වහන්සේ වාගේ පුළුල් හදවතකින් කල්පනා කිරීම' වේ. එය අපගේ ජීවිතයට බද්ධ කර ගැනීමෙන්, ආශාවන් හා ක්ෂණික කෝපය ඇති වන්නාවූ විට, ප්‍රථමයෙන් 'හොඳින් හුස්මක් ගැනීමෙන්' නොසැලී සවිමත්ව සිටීමට හැකිවනවා සේම, එය ප්‍රායෝගික පුහුණුවට ඇතුළුවීමේ දොරටුවද වේ.

## අන් අය ගැන සිතීමේ හදවතින්

රාගය (ආශාවන්), ද්වේශය (ක්‍රෝධය), මෝහය (ආත්මාර්ථකාමී අඥානකම) නැතිකර ගෙන, පුළුල් හදවතකින් කටයුතු කළ යුතුය, එහි වැදගත්කම ඔබලාත් හොඳින් අවබෝධ කරගෙන ඇතැයි සිතමි.

නමුත්, 'ඒ ආකාරයේ පුද්ගලයෙක් වෙමු', 'ආශාවන්ගෙන් ඈත් වෙමු' ලෙස පැවසුවත් 'කවදාවත් තමාට නම් ආශාවන් හා කෝපය යන ආත්මාර්ථකාමී සිතුවිලි වලින් මිදීමට නොහැකි වේ' ලෙස වැළපෙන හඬවල්ද අසා ඇත. ඒ අවස්ථාවලදී අප සිතනා ආකාරය ටිකක් වෙනස් කර 'සම්මා සංකප්ප / යහපත් සිතුවිලි' යන්නෙහි අරුත පුළුල්ව අවබෝධ කර ගතහොත් කොහොමද?

තෘෂ්ණාව, කෝපය ඇතිවන හා අන් අයට අවමන් කරන්නාවූ අයගේ හදවත් තුල 'සම්මා සංකප්ප හෙවත් යහපත් ආකාරයට කල්පනා කිරීමේ' හැඟීම නැත. එනම්, 'බෙදා හදා ගැනීමේ හදවත', උණුසුම් හදවතින් කටයුතු කිරීම', 'දයාව' නොමැත යන්නයි. තවත් කෙටියෙන් පවසනා නම් සම්මා සංකප්ප යනු, 'අන් අය ගැන සිතීම හදවතයි'. මෙහි සඳහන් වන ' සම්මා' යනු 'අන් අය ගැන සිතීමේ හැඟීම' වේ.

අප කවුරුත් අංග සම්පූර්ණ පුද්ගලයන් නොවේ. එබැවින් ඉඳහිට හෝ තෘෂ්ණාව හා කෝපය තිබුණත් 'අන් අය ගැන සිතීමේ' පුරුද්ද ඇති කර ගැනීම වැදගත්ය.

එසේ වූ විට, හැමෝමට බුදුන් වහන්සේ හා සමාන පුළුල් හදවතකින් කල්පනා කර, කටයුතු කිරීමට හැකිවේ.

කලින් සඳහන් කල 'නොසැලී සවිමත්ව සිටීමත්', 'අන් අය ගැන සිතීමේ හදවතත්' යන කරුණු ජීවිතයට බද්ධ කර ගැනීම ඉතා අසීරුය.

මා කලින් වතාවක 'හිරු මෙන්, සිහිලැල් සුළඟ මෙන්, බල කණුවක් මෙන්, විශාල ගලක් මෙන් නිහඬව සිටින්න' යැයි පාඨයක් සඳහන් කළෙමි. අන් අය සමඟ ඇතිවන ප්‍රශ්න වලින් පීඩාවට පත්ව සිත කඩා වැටෙන විට, මෙහි සදන් පරිදි නිහඬව සන්සුන්ව, හදවත පුළුල් කර ගැනීමට කටයුතු කරමු. ස්වභාව ධර්මයා සමඟ අපි එකට බැඳී සිටියි, අප ඉදිරිපිට සිටින්නාවූ පුද්ගලයන් සමඟත් අප එකට බැඳී සිටියි, යන කරුණ අවබෝධ කර ගැනීමට හැකිනම් අපගේ හදවත 'නියම රියැදුරෙක්' බවට පත් වන්නේය. එවිට බුදුන් වහන්සේ හා සමාන පුළුල් හදවතකින්, කෘතවේදීත්වයෙන් පිරිණු ජීවිතයක් ගත කිරීමට හැකිවේ.

From *Kosei*, June 2018



# 'මේ මොහොත' වැදගත්කොට සලකමු

බිමල් කාන්ති බරුවා
රිෂ්ෂෝ කෝසෙයි කායි, බංගලාදේශ ශාකාව

මෙම කතාව, 2018 වර්ෂයේ 04 වන මස 20 වනදින බංගලාදේශ ශාකාවේදී පවත්වන ලද්දකි.

ඔබ සැමගෙන් අවසරයි.

මගේ නම බිමල් කාන්ති බරුවා. මම, බිරිඳත් දුවත් පුතත් සමඟ සතුටින් කාලය ගත කරනවා. චිතගොන් දකුණු ප්‍රදේශයේ ශිබුචෝ ලෙස කටයුතු කරනවා.

මෙම කතාව කිරීමට අවස්ථාව උදවූ නිසා මාගේ ජීවිතය දෙස නැවත හැරී බැලීමට හැකියාව ලැබුනා. එබැවින් අරිතොමි ක්යෝකයිචෝ සාන් ඇතුලු බංගලාදේශ ශාකාවේ සියලුම දෙනාට හදවතින්ම ස්තූතිපූර්වක වෙනවා.

මාගේ කතාව ආරම්භයට ප්‍රථම, මට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය හඳුන්වාදුන් බිප්ලොප් බරුවා මහතාට බොහොමත්ම ස්තූතිවන්ත වනවා. ඒ 2000 වර්ෂයේදී එතුමා කිහිප වතාවක්ම මගේ නිවසට පැමිණ රිෂ්ෂෝ කෝසෙයි කායි හි ඉගැන්වීම් කියා දෙනු ලැබූ නිසාය. එසේම බංගලාදේශයට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය හඳුන්වාදුන් බිමන් කුමාර් බරුවා මහතාගේ නිවසටද මාව රැගෙන ගියා. එතුමාටද මාගේ ස්තූතිය පුදකර සිටිනවා.

මුල සිටම මාත් සමඟ එකතුවී වැඩකල සාමාජිකයන් ගොඩක් දෙනා දැන් ජීවතුන් අතර නැති වුනත්, බුදුන්ගේ ආශිර්වාදයෙන් මට තවම නීරෝගීව සිටීමට හැකි වීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

රැකියාවේ කටයුතු සඳහා කාලයක් ජපානයේ ජීවත්ව නැවත බංගලාදේශයට පැමිණියත්, ජපානය ගැන තවත් දේ දැනගැනීමට උනන්දුව තිබුනා. නමුත්, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිළිබඳ මුල් අවධියේ තේරුම් ගැනීමට හැකිවුනේ නැහැ. ඒත් සාමාජිකයන්ව අධ්‍යයනය කරන විට, අත්දැකීම් බහුල නොවුනත් ඉගෙනගත් දෑ පවුල තුළ පුහුණු කල හැකිබව තේරුම් ගිය පසු රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ විශිෂ්ටත්වය අවබෝධ වුනා.



බංගලාදේශ ශාඛාවේදී සෙප්පෝව පවත්වන
බිමල් කාන්ති බරුවා මහතා

මම සංවිධානයට ඇතුල් වුනේ විවාහ දිවියට පත්වූ කාලයේදීය. අපි මදුසමය ගත කිරීමට සිංගප්පූරුව, තායිලන්තය, නේපාලය වාගේම ඉන්දියාවටද ගියෙමි. නේපාලයේදී සයිලේන්ද්‍ර ශිබුචෝ සාන්ව මුනගැසුනා. ඒ අවස්ථාවේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය ගැන ගොඩක් ඉගෙන ගැනීමට හැකියාව ලැබුනා. නැවත බංගලාදේශයට පැමිණෙන අතරතුර කල්කටා වල සිටින නෑදෑ හිතමිතුරන්ටද මේ ඉගැන්වීම් කියා දුන්නා. පසුව එම අයද සාමාජිකයන් බවට පත්වුනා.

බංගලාදේශයට පැමිණෙන විට ජපානයේ සිට අමුත්තෙක් පැමිණ සිටින බව අසන්නට ලැබුනා. මට පළමු වතාවට ඊසවා මහතාව මුණගැසුනේ එදය. මට ජපන් භාෂාව පුලුවන් නිසා භාෂා පරිවර්තක ලෙස ඊසවා මහතා සමඟ ධර්ම ප්‍රචාරණ කටයුතු වලට සහභාගි වුනා. ඉන් පසු බංගලාදේශයේ සාමාජිකයන් 300 දෙනෙකු ඉක්මවා ගිය අවස්ථාවේදී ඊසවා මහතා ජපානයේ මූලස්ථානයෙන් ඉඩමක් ලබාගැනීමට උදවු කරනමෙන් ඉල්ලීමක් කරන ලදී. මෙම ඉඩම සොයාදුන් සන්ජිත් බරුවා බුලු මහතාව හමුවුනේ එවිටයි. ඒ මහතා දැන් ජීවතුන් අතර නොසිටියද හැම අවස්ථාවකදීම උදවු උපකාර සිදුකලා.

රිෂ්ෂෝ කෝසෙයි කායි හි සාමාජිකයෙක් වීමට ප්‍රථම මම කරන හැමදෙයම නිවැරදි කියා සිතා සිටියා. එම නිසා ගැටුම් ඇතිවුන අවස්ථාද තිබුනා. බුදුදහමේ තිබෙන විවිධ නිකායන් ගැනද අධ්‍යයනය කරමින් සිටියා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වී මුලින්ම වටහාගත් දෙය නම් බුදුන් වහන්සේගේ ධර්මය බේදී ඇති ආකාරයේ හරි වැරද්ද සෙවීමට වඩා, තමන් ඉගෙන ගත් දෙය හැකි ආකාරයට පුරුදු පුහුණු කිරීම වැදගත් බවයි. එයින් තව තවත් ධර්මය ඉගෙනීමට සිතෙහි පැහැදීම ඇතිවුනා.

ඒ කාලයේදී ජපාන මූලස්ථානයේ ගකුරින් පාසලෙන් අවුරුදු 2 ක ඉගෙනීම ලබා කංචන් බරුවා මහතා පැමිණියා. ඔහුගෙන් රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් විශාල ප්‍රමාණයක් දැනගැනීමට හැකිවුනා සේම, මේ විශිෂ්ඨ ධර්මය අන්‍යයන්ට කියාදෙන්නට ඕනැ වුනා. ඒ අතර මට බුදු පිළිමය ලැබුණා, ධර්ම ආචාර්ය තනතුරටද පත්වුනා. මුලින්ම හෝසා කණ්ඩායම් නායකයෙක් ලෙස කටයුතු කලත්, වර්තමානයේ ශිබුචෝ කෙනෙක් ලෙස ධර්ම ව්‍යාප්ත කටයුතු කරමින් සිටිනවා.

ඒ තුලින් අන් අයට ධර්මය කියාදීමේ අසීරුතාවය තේරුම් ගත්තා. හැමදම ජීවිතයට හොඳ දේ විතරක් ලගා නොවන බවත් විවිධ ප්‍රශ්ණ ගැටලු වලට මුහුන දීමට සිදු වන

බව හොඳින් තේරුම් ගැනීමට හැකිවුනා. මෙහිදී මම මුහුණ පෑ සිදුවීමක් පවසන්නම්.

මම ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක කළමනාකාර කටයුතු කරමින් සිටියා. විවිධ දේ නිසා ව්‍යාපාර කටයුතු අඩපණ වී ණය ප්‍රශ්ණයකට මැදිවීමට සිදුවුනා.

එම ප්‍රශ්ණයෙන් මිදීමට මාර්ගයක් නොමැතිව හැම දෙයක්ම අන්ධකාරයෙන් වැසීගියාක් මෙන් දැනෙන්නට වුනා. වැඩි ආදායමක් නොලැබුන නිසා පවුලේ අයව නඩත්තු කිරීමට පවා අපහසු වුනා. ඒ අතර තවත් ප්‍රශ්නයක් මතුවුනා. මාගේ මල්ලී සමඟ මුදල් ආයෝජනය කර සදනිමකල  නිවසට ගිය වියදමෙන් බාගයක් ඔහුට  අවශ්‍ය යැයි පැවසුවා. එසේ නොකලහොත් නිවස විකුණා දමන බවටත් පැවසුවා. කලයුත්තේ කුමක්ද කියා මට සිතා ගන්නටවත් බැරි වුනා, නමුත් නිවසද ආරක්ෂා නොකර බැහැ. එම අසීරු අවස්ථාවේ රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයන් මාගේ ළඟින්ම සිට මාව දිරිමත් කලා.

එම ආශිර්වාදයෙන් සිත සැහැල්ලුවට පත්වුනා. තවද එම කාලයේදී අරිතොමි කියොකයිචෝ සාන්ගේ දේශණයකට සහභාගි වීමට හැකි වුනා. එහිදී ක්යෝකයිචෝ සාන් මුහුණ දුන් ණය ප්‍රශ්නයක අත්දැකීමක් පැවසුවා.

‘තමන් සිතන ආකාරයට සෑම දෙයක්ම සිදු නොවීම සාමාන්‍ය දෙයක්. එම නිසා අතීත සිදුවීම් ගැන සිත සිතා කාලය නාස්ති කරනවාට වඩා ‘මේ මොහොත’ වැදගත් කොට සැලකීම හොඳ අනාගතයක් නිර්මාණය කරගැනීමට ඉවහල් වන බව’ පැවසුවා. ‘ගඟක උඩ සිට බොර වතුර ගලා ආවද, ගඟ මැද සිට වතුර පිරිසිදු කලහොත් පහලට බොර වතුර ගලා නොබසී. එම ආකාරයට අතීතයේ කුමක් සිදුවුනද ‘මේ මොහොත’ වැදගත්කොට සලකා කටයුතු කලවිට අනාගතය සාර්ථක වනබව’  ක්යෝකයිචෝ සාන් සරලව පැහැදිලි කර දුන්නා.

ක්යෝකයිචෝ සාන්ගේ දේශණය අවසාන වන විට මාගේ ප්‍රශ්නය විසදගැනීමට මග පෑදෙන්නට වුනා. ‘මේ මොහොත්’ වැදගත් කොට සලකා ඇතිවී තිබෙන ප්‍රශ්නයට හොඳින් මුහුණ දීමට අධිෂ්ඨාන කර ගත්තා. සාමාජිකයන්ගේ උදවු උපකාරයත් ආශිර්වාදයත් සමඟ ප්‍රශ්නයෙන් ටික ටික මිදෙන්නට හැකියාව ලැබුනා.

තවමත් විශාල ණය ප්‍රමාණයක් ගෙවීමට ඇති නමුත් කලකිරීමෙන් මිදීමට හැකිවුනා. ධර්මයේ ආශිර්වාදයෙන් අපිට ලැබෙන සෑම ප්‍රශ්න ගැටළුවක්ම අපව පෝෂණය කිරීමට අවශ්‍යය ප්‍රඥාව ලබා දෙන සිදුවීම් ලෙස බාරගැනීමට හැකියාව ලැබුනා. නිතරම මාව දිරිමත් කරමින් උදවු කල සෑමදෙනාටම හදවතින්ම ස්තූති පූර්වක වෙනවා.

ඒවාගේම රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය බිහි කල නික්යෝ නිවානෝ නිර්මාතෘ තුමාටද හදවතින්ම ස්තූතිපූර්වක වෙනවා. මෙම විශිෂ්ට සංවිධානයේ  ආශිර්වාදයෙන් අති විශාල ධර්ම කරුණු ප්‍රමාණයක් අවබෝධ කරගැනීමට හැකියාව ලැබුනා.

බුදුන් වහන්සේගේ මෙම ඉගැන්වීම් තව අයෙකුට කියාදීමේ ප්‍රාර්ථනයත් සමග ධර්ම ප්‍රචාරණ කටයුතු ආරම්භ කර, මම ඉපදුන චන්දර්පූනි ගමේ වාගේම ඩකා, චිතගොන් යන ප්‍රදේශ වලද 100 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සංවිධානයට බදවා ගන්නට හැකියාව උදවුනා. ඉදිරියටද තව තවත් විශාල පිරිසක් සංවිධානයට බදවා ගෙන ධර්ම මාර්ගය පෙන්වීමට මහන්සියෙන් කටයුතු කරමි.

මම ඉපදුන  චන්දර්පූනි ගමේද  ධර්ම ශාඛාවක් බිහි කිරීමට හැකියාව  ලැබුණි. එසේම ඉන්දියාවේ කල්කටා, බුද්ධගයා සහ තව විවිධ ස්ථානවල ධර්ම ප්‍රචාරන කටයුතු හොඳින් සිදුවන බව දැනගන්නට ලැබී හදවතින්ම සතුටට පත් විය. මන්දයත් ඒ කාලයේ දකුණු ආසියාව භාරව කටයුතුකල සයිතෝ මහතාගේ මාර්ගෝපදේශය මත මම කල්කටා ප්‍රදේශයට ගොස්, ෂුමොන් මහතා සමඟ ධර්ම ප්‍රචාරණ කටයුතු සිඳුකල ආකාරය මතකයට නැගෙන නිසාවෙනි.

ෂුමොන් මහතා කල්කටා වල සිට බංගලාදේශයට පැමිණ බුද්ධ රූපය ඉන්දියාවේ තමාගේ නිවසට රැ ගෙනගොස් තැන්පත් කරන ලදී. මමත් 3 වතාවක් පමණ කල්කටා වලට ගොස් 36 දෙනෙකු පමණ සංවිධානයට බඳවා ගත්හ. මේ වනවිට කල්කටා ප්‍රදේශයේ අනු ශාකාවක් ලෙසද ෂුමොන් මහතා ශිබුචෝ ලෙසද කටයුතු කරනවා. ෂුමොන් මහතාගේ පියාටත් නැගණිය වන සුෂ්මිතා මහත්මියටද ස්තූතිවන්තවනවා.

තමන් පමණක් සතුටින් කාලය ගතකිරීම නොව, අන් අයගේ සතුටද ප්‍රර්ථනා කරමින්, එක්ව සතුටට පත්වීම වැදගත්ය. ඒ වෙනුවෙන් නිරිමාතෘතුමාගේ කියාදීම් සිතේ තබාගෙන,  විශාල පිරිසකට මෙම ධර්මය කියාදීමට වෙහෙස වෙමි. බංගලාදේශ ශාකාවට මෙම වසරේ  අවුරුදු 20 ක් පිරෙයි. ඒ වෙනුවෙන් අරිතොමි ක්යෝකයිචෝ සාන්ගේ උපදේශය වූවේ, මේ දක්වා ශාඛාව ගොඩනැගීමට දයක වු ජ්‍යේෂ්ඨ සාමාජිකයන්ට ද ස්තූතිවන්ත විය යුතු බවත්, සියලු දෙනාව දුකින් මුදවා ගැනීමට ධර්ම මාර්ගය පෙන්වා දිය යුතු බවත්ය. මමද  බංගලාදේශයේ එක් සාමාජිකයෙක් ලෙස මින් ඉදිරියටත් ධර්ම ප්‍රචාරණය සඳහා ඇපකැපවී කටයුතු කරන බවට දිවුරා පොරොන්දු වෙමි.



*දේශනයකට සහභාගී වී සිටින*
*බිමල් කාන්ති බරුවා මහතා*

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
16 වන පරිච්ඡේදය

තථාගතයන් වහන්සේගේ සදාතන ජීවිතය පිළිබඳ විවරණය

## ආශ්චර්යමත් වෛද්‍යවරයාගේ උපමාව



එක් දුරු රටක, පුළුල් දැනුමකින් යුතු වෛද්‍යවරයෙක් සිටියහ. ඕනෑම අසනීපයක් සුව කල හැකි එම වෛද්‍යවරයාට, දරුවන් විශාල ප්‍රමාණයක් සිටියහ. වෛද්‍යවරයා ඉතා දුර රටකට ගොස් සිටිනා වේලාවේදී, දරුවන් වැරදීමකින් වස පානය කලහ. විස ශරීරගත වීමෙන් දරුවන් පීඩාවට පත්ව සිටියහ. එවිට වෛද්‍ය පියා නැවත නිවසට පැමිණියහ. එයින් දරුවන් ඉමහත් සතුටට පත් විය.



දරුවන් සිදුවූ දෙය පියාට පැහැදිලි කර දී, තම ජීවිත බේරා දෙන ලෙස ඉල්ලුහ. සැනෙකින් රසවත්, සුවඳවත්, පෙනුමැති බෙහෙත් පියා විසින් දරුවන්ට ලබා දුන්හ. 'මෙම බෙහෙත් බොන්නේ නම්, දැන් තිබෙන වේදනාව සුව වෙනවා පමණක් නොව, ඉදිරියටත් අසනීපයක් නොවී සිටිය හැකිය' ලෙස පැවසූහ. සිහි කල්පනාව තිබුණ දරුවන් බෙහෙත් පානය කලහ. නමුදු අවාසනාවට , විශාල ලෙස වස පෙවී සිටි අය මෙම බෙහෙත බොන්නටවත් සිතන්නේ නැත.



පියා බෙහෙත් පානය කරන්නටවත් සිතන්නේ නැති අය දෙස බලා , (කණගාටුදායකය, වස පානය තුලින් දරුවන්ගේ සත්‍ය ස්වරූපය නැති වී ඇත) යැයි සිතූහ. වෛද්‍ය පියා, දරුවන් ගැන දරුවන් ගැන අනුකම්පා කර, එක් කෙනෙක් හෝ ඉතිරි නොකර සැවොම දුකින් මුදවා ගන්නා මාර්ගයක් කල්පනා කලහ. ඉන් පසු දරුවන්ට අනිවාර්යයෙන් බෙහෙත් බොන්න යැයි පවසා නැවත වතාවක් දුරු රටකට ගොස්, 'පියා මිය ගියේ' යැයි පණිවුඩයක් එවීය. එය ඇසූ දරුවන් තිගැස්සීමට පත් වී, බෙහෙත් බොනවා හැර වෙන කිරීමට දෙයක් නැතැයි සිතූහ. ඉන් පසු දරුවන් බෙහෙත් බී වස පානයෙන් දැනුනු වේදනාව සමනය කර ගත්හ. දරුවන් සුව වූ බවට තහවුරු කර ගත් පියා , නැවතත් දරුවන් ලගට පැමිණියහ.



## අර්ථකථනය

වෛද්‍ය පියා බුදුන් වහන්සේය, දරුවන් නම් අපගේ ස්වරූපයයි. විස නම් රාග, ද්වේශ, මෝහයයි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බෙහෙත් වේ.

සදාතනික ආදීබුද්ධ වූ සද්ධර්මය නිතරම අප අවට සිටී. නමුත් මනුෂ්‍යයින් වන අප ඒ ගැන අවබෝධයක් නොමැතිව, අප අවට සිදු වන්නාවූ දේ පිළිබඳව මැසිවිල්ලෙන් වේදනාවට පත්වේ.

එහිදී බුදුන් වහන්සේ, සෑම සියළු  දෙයක්ම හේතුවක් හා සහසබධතාවය මත හට ගන්නා වූ තාවකාලික දෑ බව පැහැදිලි කර දී, මෙම ධර්මය ශ්‍රවණය කර, භාරගන්නේ නම් ඇලීමෙන් තොරව සිතේ සුවය අත් කරගත හැකි බව පැවසූහ.

නමුත්, ධර්මාවබෝධය ලබා ගත් පුද්ගලයන් පවා, බුදුන් වහන්සේගෙන් ඈත් වන විට ආත්මාර්තකාමීත්වයට පත්ව, ධර්මයෙන් මෑත් වූ ජීවිතයක් ගත කරයි. ඒ ගැන බුදුන් වහන්සේ අවබෝධ කරගෙන මෙම උපමා කථාව දේශනා කලහ.

පියා නිවසේ නොමැති වේලාවේ වස පානය කර පීඩාවට පත් වූ දරුවන්, ආපසු පැමිණි පියා දැක සතුටට පත්විය. එයින් තෘෂ්ණාවෙන් මුලාවී සිටිනා වූ පිරිස බුදුන් වහන්සේගේ දරුවන් වන බැවින්, බුදුන් වහන්සේව දැකීමෙන් ඔවුන් තුල ඇතිවන සතුට එයින් පෙන්වයි.

බුදුන් වහන්සේ දුකට පත්ව සිටින සියළුම සත්වයින් එයින් මුදවා ගැනීම සඳහා නොයෙකුත් බෙහෙත්  රසවත්ව, සුවදවත්ව, පෙනුමැතිව සෑම කෙනෙකුගේම ආබාධයන්ට ගැලපෙන ආකාරයට පිළියෙල කලහ. ඒ 'එක් අයෙකු හෝ ඉතිරි නොකොට දුකින් මුදවා ගත යුතුයි' යන බුදුන් වහන්සේගේ මෛත්‍රිය හා කරුණාවයි.

ඉක්මණින්ම බෙහෙත් පානය කල දරුවන් වාගේ, ධර්මය අවංකව භාර ගන්නා අයට දුකින් මිදීමට හැකිවේ. නමුදු කොපමණ කියා දුන්නත් ධර්මය භාර නොගන්න පිරිස්ද සිටියි. ඒ මන්දයත් තෘෂ්ණාවෙන් බරිත වී සිටින නිසාය. එබැවින් කොපමණ හොද බෙහෙත් වුවද බීමට නොහැකි යයි සිතයි. තමාට අවශ්‍ය ආකාරයට ජීවිතය ගත කරන්නාවූ පුද්ගලයන්, බුදුන් වහන්සේගේ ධර්ම අනුශාසනා පලක් නොමැති බවටත්, බෝධිසත්ව චර්යයාව වදයක් ලෙසද සිතයි.

ඒ ආකාරයට සිතන්නාවූ පුද්ගලයන්ගේ දෑස මානයෙන් බුදුන් වහන්සේ නොපෙනී යයි. ඒ බව මේ බුදුන් වහන්සේ පහලව පරිණිර්වානයට පත් වීමයි. බුදුන් වහන්සේ නොපෙනෙන විට මනුෂ්‍යයින්ගේ සිත් තුල 'තනියම හෝ මේ ගමන යා යුතුය' යන හැඟීම ඇතිවේ. ශ්‍රද්ධාව යනු, තමා විසින්ම ධර්මය ඉගෙනගත යුතුය යන හැඟීම ඇති කරගෙන, ප්‍රයෝගිකව ධර්මයේ හැසිරීම ඉතා වැදගත්ය. එම කරුණ අවබෝධ කර දීමට බුදුන් වහන්සේ නොපෙනීයයි.

අවසානයේදී, බෙහෙත් පානය කර නැවත සිහියට පත්වූ පසු, මිය ගියා යැයි පැවසූ පියාගේ ස්වරූපය දකින්නට හැකි විය. එයින් අර්ථ ගැන්වෙන්නේ, ධර්මය භාරගෙන, හදවතින්ම ශ්‍රද්ධාවෙන් කටයුතු කරන්නේ නම් බුදුන් වහන්සේව දැකීමට හැකි බවයි. එනම් බුදුන් වහන්සේ නිතරම අප අවට සිටින බව තමාටම අවබෝධ වේ.

සංස්කරණ සහය  Chuo Academic Research Institute






# අන් අය ගැන සිතීමේ හදවත

අප්‍රේල් මස 29 වන දින තෝකියෝ වල ජේෂ්ඨ පිරිමි නායකයින් විසින්, කඩා ඉවත් කිරීමට තීරණය වු ෆුමොන් ගොඩනැගිල්ල වෙනුවෙන් කෘතවේදී සුත්‍ර සක්ඣායනක් සිදු කලහ.

එම සුත්‍ර සක්ඣායනට පෙර ෆුමොන් ගොඩනැගිල්ලේ අරුථ පැහැදිලි කල නිර්මාතෘ තුමාගේ පටිගත කල දර්ශනයක් පෙන්වූහ. එහි සඳහන් වුවේ, ෆුමොන් ගොඩනැගිල්ල 5000 ක පිරිසකට අසුන් ගැනීමට හැකි ආකාරයට නිර්මාණය කලේ, සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ 2 වන පරිච්ඡේදය වන උපායකෞෂල්‍ය හි බුදුන් වහන්සේගේ ධර්මය අසන්නේ නැතිව විසිර ගිය 5000 ක පිරිසට ඕනෑම වෙලාවක සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය ශ්‍රවණය කිරීමට හැකිය යන සිතුවිල්ලෙන් බවයි. මම පුදුමයට පත් විය. නිර්මාතෘ තුමාගේ අන් අය ගැන සිතීමේ පුළුල් හදවත ගැන ප්‍රමෝදයට පත් විය.

නිච්කෝ නිවානෝ තුමාගේ මේ මස මාසික පණිවුඩයෙහි 'අන් අය ගැන සිතීමේ හදවතින් කල්පනා කරමු' ලෙස ඉගෙන ගතිමි. එසේම නිර්මාතෘ තුමාගේ ආභාෂයද ලබමි තව තවත් අන් අය ගැන සිතන පුද්ගලයෙක් බවට පත් වීමට මම අධිෂ්ඨාන කරමි.

රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා




RISSHO KOSEI-KAI INTERNATIONAL BRANCHES

**We welcome comments on our newsletter *Living the Lotus*:** living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai
# Overseas Dharma Centers 2018

**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street Suite #1 Los Angeles CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way,
WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927 *e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona,
HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/˜rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100 Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701 Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi,
110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka, New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna Dharma Center**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Other Groups**
**Rissho Kosei-kai Friends in Shanghai**